v. මෙම වචනවල අර්ථය ලියන්න. 1.කාලක්‍රියා කිරීම - ...................................... 2.පැස - ............................................
’
( ලකුණු 4×5 = 20)

බදුල්ල අධ්‍යාපන කලාපය

# සිංහල භාෂාව හා සාහිත්‍යය තරගාවලිය. 2018

10 ශ්‍රේණිය

පද්‍ය නිර්මාණය හා අවබෝධය.

නම :-........................................................................................................... කාලය :- පැය 02 යි.

පාසල :-....................................................................................... පාසල් වර්ගය :- 200 තෙක් / 201-500 තෙක් /500 ට වැඩි

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

**(1)** කොටස

- කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

  දුටු පහත සත සිතට තුටු වන ලෙසට නිතියෙනි
  සතරත එකට සමකර බෙර ඇසක් මෙනි
  පැහැපත යුද නොහළ වැලි අතුළ මළුවැනි
  මිහිකත සඳනලෙව් දුන් උරමඬල වැනි

i. ඉහත කවියේ එක්එක් පේළියේ අඩංගු මාත්‍රා ගණන දක්වන්න.
ii. එකී මාත්‍රා ගණන අඩංගු කවි අයත් විරිත නම් කරන්න.
iii. ඉහත කවියේ අර්ථය ලියන්න.
iv. මෙම කවියත් උද්දීපනය වන අර්ථාලංකාරය කුමක්ද?
v. ඉහත කවිය අයත් කෘතිය හා කතුවරයා නම් කරන්න. ( ලකුණු 10යි.)

2. පහත දැක්වෙන එක් එක් වාක්‍ය කොටස් ඇතුළත් කරමින් ඒ ඒ වාක්‍යය කවි පද 2 බැගින් තනන්න
   i. අගනා මුතු එකමුතුය
   ii. සුවඳ රෝස මලක් වගේ
   iii. ගෙදර බුදුන් සදිසි
   iv. දුදුලන මිණි පහන වගේ
   v. දිදුලන තරු ඇති ආකාසේ

(ලකුණු 10යි.)

03. පහත කවිය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

ගිය ගිය තැන නිදි කිරා වැටෙන්නේ
කට අරිමින් ඇනුම් අරිමින්නේ
මුළු ලොව ගිල දමනට සැරසෙන්නේ
ගතියක හැටි කැත කම්මැලියන්නේ

i. ඉහත එක් එක් කවිපාද වල ලඝු ,ගුරු අක්ෂර ගණන වෙන් වෙන්ව දක්වන්න.
ii. මෙම කවියේ ශබ්ද රසය ඉස්මතු කිරීමට කවියා යොදාගත් අලංකාරය කුමක්ද?
iii. මෙම කවියේ දැක්වෙන පරිදි කම්මැලියාගේ ගති ලක්ෂන 2ක් ලියන්න.

(ලකුණු 10යි.)

04. පහත දැක්වෙන වාක්‍ය කාණ්ඩවල ඇති රූපක වෙන් කරන්න.

i. අද්දැකීම් ලබමින් ගෙවන ජීවිතය ගලන ගඟකි.ගැටලුවලින් සපිරි ජීවිතය ප්‍රශ්න පත්‍රයකි.
ii. ගෙදර බුදුන් අම්මා වනු සේම නිවසේ ඉටුදෙවි පියාය.
iii. නෙත නිලුපුල් ,වත රතුපුල් පුංචි දියණියේ.
iv. පාපියුම් නමදිමි,වත කමලින් සැනසෙමි.
v. මල් හිනාවක් ඇතත් ඔහුට ඇත්තේ ගල් හිතකි. (ලකුණු 10යි.)

05. පහත සඳහන් චිත්‍රය දෙස බලා ඔබ කැමති විරිතකට අනුව කාව්‍ය පහකට නොඅඩු වන සේ කාව්‍ය නිර්මාණයක් කරන්න.



(ලකුණු 10යි.)

(11 කොටස)

මෙම කොටසේ ඇති (අ) (ආ)කොටස් වලින් එකක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

(අ) පහත දැක්වෙන තේමා අතරින් එකක් තෝරා ගෙන පද්‍ය පන්තියක් නිර්මාණය කරන්න.
( කවි 5ට වැඩි 10ට අඩු)

i. සුන්දර ශ්‍රී ලංකා.
ii. සුරකිමු පරිසරය දෙනෙත් මෙන්.
iii. හෙට ලොව ජීවය ළමා පරපුරයි.

(ආ) පහත කවිවලට පිළිතුරු කවි ලියන්න. (එම විරිතෙන්ම ලිවීම අවශ්‍යවේ)

i. කවුදැයි ලෝකෙට එළිය ගෙනෙන්නේ

කවුදැයි ලෝකෙට අඳුර ගෙනෙන්නේ

කවුදැයි ලෝකෙට සෙවන ගෙනෙන්නේ

කවුදැයි ලෝකෙට ජවය ගෙනෙන්නේ

ii. සිත තොසින් තැබුමට
ගත සුවෙන් විඳුමට
නෙත කෙළින් බැලුමට
අත නොදෙන් කුමකට

iii. මඟ නොමඟ දැනගෙන
කළ නොකළ දේ ගැන
හොඳ නොහොඳ හඳුනන
කෙනෙක් යැයි කිව හැකිද ඔබ ගැන

iv. දනට පිනට ඔබෙ සිත යොමු වන්නේද
රටට දැයට සෙත සැලසුම ඇතිවේද
අතට පයට සවි ශක්තිය ලැබේවිද
ලොවට හෙටට සත් මිනිසුන් බිහිවේද

v. ඔබ මීස
මා හස
දෙනු කිස
කී බස

(ලකුණු 50යි.)